ජනමාධ්‍ය අමාත්‍යාංශය
வெகுசன ஊடக அமைச்சு
Ministy of Mass Media

සැලසිනෙ
செலசினே
SELACINE
SELACINE TELEVISION INSTITUTE

2020

වාර්ෂික වාර්තාව

ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා
ජනමාධ්‍ය අමාත්‍යාංශය
කොළඹ 05.

ගරු අමාත්‍යතුමනි,

වාර්ෂික වාර්තාව - 2020

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2020 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.



හරිත් ගුණවර්ධන
සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය
කොළඹ 07

පෙළ ගැස්ම

දැක්ම, මෙහෙවර, අරමුණු	05
සභාපතිතුමාගේ සමාලෝචනය	07
ආයතනික තොරතුරු	08
පරිපාලන ව්‍යුහය 2020 හා සම්බන්ධ තොරතුරු	09
මූල්‍ය වාර්තා - 2020	13
මූල්‍ය වාර්තා සඳහා සටහන්	16
ආදායම් ප්‍රකාශය	18
ශේෂ පත්‍රය	19
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	20
මූල්‍ය වාර්තා සඳහා සටහන්	22
2020 වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ විගණකාධිපතිතුමාගේ මතය	31

දැක්ම, මෙහෙවර සහ අරමුණු

මෙහෙවර

නිපුණත්වයෙන් හෙබි වඩාත් නිර්මාණශීලී හා දිරිමත් පුද්ගල සහය භාවිතා කරමින් උපක්‍රමශීලිත්ව මෙන්ම උසස් තලයේ තාක්ෂණය ද නිර්මාණාත්මකව උපයෝගී කරගනිමින් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා සන්නිවේදන සහ වෙනත් නිර්මාණශීලී ප්‍රචාරාත්මක අනඟි සේවාවක් සැපයීම තුළින්

ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය සහ දේශපාලන සංවර්ධනය සඳහා සක්‍රීයව දායක වීම.

දැක්ම

රාජ්‍ය යාන්ත්‍රණයේ සංවර්ධන හා මෙහෙයුම් සහ සියලු ව්‍යාපාර ක්ෂේත්‍රයන්හි ප්‍රවර්ධනයන් නිර්මාණාත්මකව සන්නිවේදනය කිරීම තුළින් ප්‍රචාරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීම

අරමුණ

මූල්‍ය තත්ත්වය ඉහළ දැමීම.

වෙළෙඳපොල ලාභය ඉහළ දැමීම.

සේවාලාභී සංස්කෘතිය ඉහළ දැමීම සඳහා වූ උපක්‍රම ක්‍රියාත්මක කිරීම.

ආයතන සේවකයින් සහ නායකයින් වර්ධනය කිරීම.



සභාපතිතුමාගේ සමාලෝචනය

මා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ සභාපති ධූරයට පත්වීමෙන් අනතුරුව ආයතනය විසින් එළිදක්වනු ලබන දෙවැනි වාර්ෂික වාර්තාව වන අතර, 2020 වර්ෂයට අදාළව පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම ගැන සතුටු වෙමි.

පසුගිය වසර 38 ක කාල පරිච්ඡේදය දෙස හැරී බැලීමේ දී පැහැදිලිව දැකගත හැකි දෙයක් වනුයේ විවිධ හැල හැප්පිලි තුළින් ආයතනය පෙරට පැමිණ ඇති බවකි. 2020 වර්ෂය තුළ කොවිඩ් වසංගත තත්වයත් සමග ආයතනය අභියෝග රැසකට මුහුණ දී ඇත.

2020 වර්ෂයේ ආදායම ලෙස රු.මිලි 233.8 ක් ලෙස සැලසිනෙ ආයතනය උපයා ගෙන ඇතත්, රටේ පැවැති වසංගත රෝග තත්ව හේතු කොට ගෙන, එම වසරේ ලාභ උපයා ගැනීම ඉතා අසීරු කාර්යක් වී ඇත. ඒ අනුව, මිලි. 29.3 ක අලාභයක් පෙන්නුම් කිරීම තුළින් ආයතනයේ පසුබෑමක් දක්නට ලැබුණි. රටෙහි පැවැති ආර්ථික පරිසරයේ ඇති වූ වෙනස්කම් තුළින් ඒ සඳහා බලපෑම් ඇති වී ඇත.

රජයේ එකම ප්‍රචාරණ ආයතනය ලෙස සැලසිනෙ ආයතනයට පැවරෙන වගකීම් නිසි ලෙස ඉටුකර ගැනීමට සියළු දෙනාම එක්වීම තුළින් අරමුණ ජයග්‍රහණය කිරීම මෙම යුගයේ කාර්යභාරය වනු ඇත.



හරිත් ගුණවර්ධන
සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය

ආයතනික තොරතුරු

නාමය

සැලසිනෙ රූපවාහිනී ආයතනය

නීතිමය ස්වරූපය හා අතීත කාර්ය ස්වභාවය

- 1982 පෙබරවාරි 01 දින සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ අධිකාරිත්වය යටතේ ආරම්භ විය.
- 1982 සිට 1989 දක්වා ඉඩම්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය දැව සංස්ථාවේ මානව හා මූල්‍ය සම්පත් යටතේ මහවැලි කඩිනම් සංවර්ධන වැඩසටහන පිළිබඳ ශ්‍රී ලාංකීය ජනතාව දැනුවත් කිරීමේ කාර්යය සිදුකිරීම.
- 1989 ජනසවිය වැඩසටහනේ ප්‍රචාරාත්මක කාර්යභාරය සිදුකිරීම.
- 1989.08.19 දිනැති අංක 832/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් සැලසිනෙ ආයතනය යෞවන කටයුතු, ක්‍රීඩා හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතට පවරන ලදී. (මෙය ආයතනය සම්බන්ධව ගැසට් නිවේදනයක් මගින් කරනු ලැබූ පළමු පැවරීමයි)
- 1997.06.09 දිනැති අංක 979/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් තැපැල්, විදුලි සංදේශ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2001.12.20 දිනැති 1215/14 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනසන්නිවේදන අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2004.04.28 දිනැති 1338/9 දරන අති විශේෂ ගැසට් නිවේදනය තුළින් තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස නම් කරනු ලැබීය.
- 2005/12/08 දිනැති 1422/22 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස ස්ථාපිත කරනු ලැබීය.
- 2007 අංක 07 දරන සමාගම් පනතෙහි විධිවිධානයන්ට අනුව පූර්ණ අයිතිය රජයට හිමි පොදු සමාගමක් බවට පත්කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත 2008. 03. 26 දිනැති සන්දේශය ඉදිරිපත් කෙරුණි.

ආයතනික කාර්ය භාරය

- රජයේ මාධ්‍ය ප්‍රචාරණ හා නිෂ්පාදන ආයතනය ලෙස ක්‍රියාත්මක වීම.
- 2005. 05. 16 දින අංක 1380/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් පහත සඳහන් කරුණු කාර්ය විෂය පථයට ඇතුළත් කෙරුණි.
    - i. මුද්‍රිත / විද්‍යුත් මාධ්‍ය දැන්වීම් නිෂ්පාදනය
    - ii. රජයේ සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරක කටයුතු
    - iii. රජයේ ප්‍රචාරක වැඩසටහන් නිෂ්පාදනය
- 2008.12.02 දිනැති ජනමාධ්‍ය හා තොරතුරු ගරු අමාත්‍යතුමාගේ සංදේශය සම්බන්ධ නිරීක්ෂණයෙන් අනතුරුව 2008.12.24 දිනැති අංක 08/2253/338/043 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් සියලුම අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති ආයතනවල සියලුම වෙළෙඳ දැන්වීම් හා ප්‍රචාරාත්මක වැඩසටහන් සැලසිනෙ රූපවාහිනී ආයතනය මගින් ඉටුකරවා ගැනීම අනිවාර්ය කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.
- රූපවාහිනී වාර්තාමය වැඩසටහන්, ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම රූපවාහිනී හා ගුවන් විදුලි වෙළෙඳ දැන්වීම් යනාදී ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයන් නිෂ්පාදනය කිරීම
- විවිධ වූ පුවත්පත් දැන්වීම් නිර්මාණය මෙන්ම එම දැන්වීම් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හි උපලේඛනගත කිරීම.
- ඉසව් කළමනාකරණය හා මුද්‍රණ කටයුතු.

පරිපාලන ව්‍යුහය - 2020

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

ඒ. එච්. ලක්ෂාන් ද සොයිසා	- සභාපති (වැ.බ)	(2019.12.13
එස්. ඒ. ආර්. එන්. සුබසිංහ	- සභාපති	(2020.08.13 - 2020.12.15)
දේශබන්දු අමිල මොරේමඩ	- සභාපති	(2020.12.17 - 2021.12.29)
එච්.එම් මංජුල හේරත්	- සාමාන්‍යාධිකාරී	

කළමනාකරණය

ඩබ්. පී. සෙව්වන්දි මිය	- කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන - වැ.බ)
සුනන්ද වීරසිංහ	- කළමනාකරු (ශ්‍රව්‍ය/දෘෂ්‍ය) නිෂ්පාදන
අග්බෝ අමරසේකර	- ප්‍රධානී (ව්‍යාපාර සංවර්ධන)
නලින් අලහකෝන්	- කළමනාකරු (මාධ්‍ය)
ඩබ්. එම්. එම්. බී. එච්. ගුණරත්න	- ගණකාධිකාරී
සුපිත් පුෂ්පකුමාර	- කළමනාකරු (ග්‍රැෆික්)
අයි.විල්.පී ප්‍රනාන්දු	- කළමනාකරු (අධිවේගී මුද්‍රණ)
ප්‍රභාත් කහදුවආරච්චි	- කළමනාකරු (ඉසව්)
ඉන්දික විජේතුංග	කළමනාකරු (මිලදී ගැනීම් හා සැපයුම්)

විගණක

රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකුකරුවන්

ලංකා බැංකුව

මහජන බැංකුව

සම්බන්ධීකරණ තොරතුරු

ලිපිනය	-	අංක. 380/57, සරණ පාර, කොළඹ 07
දුරකථන	-	011-4320777, 011-4061586
ෆැක්ස්	-	011-2058229
විද්‍යුත් තැපෑල	-	selacine@gmail.com
වෙබ් අඩවිය	-	www.selacine.lk

නිර්මාණ සහ ග්‍රැෆික් අංශය

වෙළෙඳ ප්‍රචාරණ ක්ෂේත්‍රයේ ග්‍රැෆික් නිර්මාණ කාර්යය තරඟකාරී අංශයක් මෙන්ම නිර්මාණශීලීත්වය තුළ කටයුතු කිරීමෙන් වඩාත් ඵලදායී ප්‍රතිඵල උකහාගත හැකි ක්ෂේත්‍රයකි. සැලසිනෙ ආයතනය තුළ නිර්මාණ සහ ග්‍රැෆික් අංශය ගතවූ කාලය තුළ සෙසු අංශ වල කාර්යයන්ගේ සාර්ථකත්වය පසුපස සිටිමින් නිහඬ කාර්යභාරයක නිරත විය.

සැලසිනෙ රූපවාහිනී ආයතනයේ ප්‍රචාරක දැන්වීම්, පුවත්පත් දැන්වීම්, බිල් බෝඩ්,අත් පත්‍රිකා ඇතුළු නිර්මාණ කාර්යයන් රැසක් අප වෙත දෛනිකව පැවරෙන කාර්යය අතර වෙයි. එහිදී නිර්මාණශීලීත්වය, නව තාක්ෂණික දැනුම, තුළින් යාවත්කාලීන වෙමින් ආයතනයේ ගමන් මගට ශක්තියක් සපයන පිරිසක් ලෙස කටයුතු කිරීමට නිර්මාණ හා ග්‍රැෆික් අංශයේ කණ්ඩායම සිය උපරිම දායකත්වය ලබාදෙති.

වෙළෙඳ දැන්වීම් ක්ෂේත්‍රය ඉදිරියට ගමන් කරමින් සිටිනුයේ දැඩි තරඟකාරී සහ නිර්මාණශීලි නව තාක්ෂණික උපායමාර්ග සමගය. එහිදි කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ පවා ආයතනයේ සෙසු අංශවල කාර්යයන්ට සහාය වෙමින් අසීරු ඉලක්ක පසු කිරීමට අප අංශය සහයෝගයෙන් සිය දායකත්වය සැපයීම තුළින් සාර්ථකත්වය වෙත සාමූහිකව ලඟාවීමට හැකිවීම සතුටට කරුණකි. ග්‍රැෆික් නිර්මාණ අංශයේ කාර්යභාරය කාර්යාල වේලාවට පමණක් සීමාවන්නක් නොවේ. එනිසා නිර්මාණ ක්‍රියාවලිය නිරන්තරව රඳවා ගනිමින් ආයතනයේ ප්‍රගතියට විශාල දායකත්වයක් සැපයීම අප ග්‍රැෆික් අංශයට අනිවාර්ය වූවකි.

නව පරිපාලනය සමග අත්වැල් බැඳාගනිමින්, කාර්යසාධන උපදෙස් අනුව වඩාත් සක්‍රීය අංශයක් ලෙස වාර්ෂික ආදායම් ඉලක්ක සපුරාගැනීම සඳහා අවශ්‍ය උපරිම දායකත්වය සැපයීම වෙනුවෙන් නිර්මාණ සහ ග්‍රැෆික් අංශය කැපවී සිටින බව සතුටින් දැනුම්දීමට කැමැත්තෙමු.

මාධ්‍ය අංශය

මාධ්‍ය අංශයේ ප්‍රමුඛ කාර්යභාරය වන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හී දැන්වීම් සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ උපලේඛනගත කිරීම් සහ සමාජ මාධ්‍යයන්හි ප්‍රචාරයන්ය. එය සෑම වර්ෂකයම වැඩිම ආදායම් උපදවන්නේ මාධ්‍ය අංශයේ උපලේඛනගත කිරීම් තුළිනි. ඒ අනුව 2020 වර්ෂයේද වඩාත් කාර්යක්ෂමව සිදුකරන ලදී. මෙහිදී සමස්ත ආයෝජනය රු. මිලියන 178,035,800/- කි.

2020 වර්ෂය ලෝකයේ බියකරුම කොවිඩ් වසංගත තත්වය හමුවේ උවද අප ලබා ගත් මෙම ආදායම වඩාත් ප්‍රශස්ථ මට්ටමක තිබෙන බවට අපගේ හැඟීමයි, මෙහිදී මාධ්‍ය අංශය හමුවේ විශාල අභියෝග යකට මුහුණ දීමට සිදුවූයේ මෙම දැන්වීම් උපලේඛනගත කිරීමේදී මාධ්‍ය ආයතනය හා සම්බන්ධීකරණය නිවසේ සිටම සිදුකිරීමට වීමයි එහිදී අපගේ ඉහළ කළමනාකාරීත්වය විසින් ඒ සඳහා විශාල සහයෝගයක් මාධ්‍ය අංශය වෙත ලබාදෙන ලදී.

තවද රූපවාහිනී හා ගුවන්විදුලි උපලේඛනගත කිරීම් සඳහා අප වෙත විශේෂ වට්ටම් ප්‍රතිශතයක් ලැබෙන අතර, මීට අමතරව වර්තමානය වන විට සමාජ මාධ්‍ය ජාලා වෙබ් අඩවි තුළ ප්‍රචාරන කාර්යයන් සිදුකිරීම ඉතාමත් ආකර්ෂණීය අංගයක් බවට පත්ව ඇත. ඒ අනුව අපගේ මාධ්‍ය අංශයෙහි සමාජ මාධ්‍ය අංශයක් වෙනම ඇත. එහිදී අපගේ නිර්මාණාත්මක කාර්යයන් ප්‍රචාරය කරනු ලබයි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙලේ දැන්වීම් ප්‍රචාරන නියෝජිත ආයතනයක් ලෙස අපගේ නිර්මාණ කාර්යයන් පමණක් නොව ප්‍රචාරණයේ ඉහළ මට්ටමේ හැකියාවන් සැලසිනෙ සතු බව මෙයින් පෙන්නුම් කෙරේ.

අලෙවි හා පාරිභෝගික සේවා අංශය

2020 වර්ෂය පාරිභෝගික අංශයට අභියෝගාත්මක වන වසරක් වූ අතර, රටෙහි පැවැති වසංගත රෝග තත්වයන් මත බොහෝ ආයතන වසා දමා ඇති තත්වයක් මත, අපගේ වෙළෙඳ ඉලක්කයන් සපුරා ගැනීම ගැටළුකාරී තත්වයක් විය. මෙවැනි පසුබිමක් මත මුළු අලෙවි ආදායම වූ රු. 233,865,842/- ක් ලබා ගැනීමට හැකි වීම ද වික්තරා ජයග්‍රහණයකි.

මෙහිදී, පුවත්පත්, ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය උපලේඛන ගත කිරීම තුළින් ඉපයූ ආදායම රු.178,035,800/- ක මුදල විශේෂත්වයක් වූ අතර, උත්සව කළමනාකරණ ආදායමෙහිද යම් සාධාරණීය ලක්ෂණයන් පෙන්නුම් කර ඇත.

තවද, නිර්මාණශීලි මුද්‍රණ කටයුතු ආදායමෙහි ද යම් ප්‍රගතියක් සනිටුහන් වීමද විශේෂයත්වයක් ලෙස සැලකිය හැක.

මානව සම්පත් හා පරිපාලන අංශය

මානව සම්පත් හා පරිපාලන අංශය යනු ඕනෑම ආයතනයක හද ගැස්ම හොඳින් හඳුනන ස්ථාන යයි. සැලසිනෙ ආයතනය තුළ අපගේ අංශය ද ගත වූ සෑම වසරකම මෙන් 2020 වසර තුළත් දෛනික පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ කාර්යයභාරයට අමතරව තවත් සේවා රැසක් ආයතනයේ සේවක පිරිස්වල සුභසාධනය වෙනුවෙන් ඉදිරියට ගෙන ඒමට සමත් විය.විවිධ අංශවල කාර්යය මණ්ඩල සේවකයින් ගේ ගැටළු මෙන්ම ඔවුන්ගේ සුභසාධන කාර්යයන් ද උපරිම ආකාරයෙන් ඉටු කිරීමට අප අංශයේ කාර්යය මණ්ඩලය කැපවී ක්‍රියාකලේ කොවිඩ් වසංගතය තුළ විවිධ අභියෝග සමග එක් කණ්ඩායමක් ලෙස ක්‍රියාකරමිනි.

- ගතවූ වසර තුළ අප අංශයෙන් ආයතනයේ නිලධාරීන් සහභාගී කරවාගෙන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළෙමු.
- සමස්ත කාර්යය මණ්ඩලයේ ආකල්ප වර්ධනය කිරීම සඳහා වැඩමුළුවක් සංවිධානය කර එහි ප්‍රගතියක් අත්පත් කරගැනීමට සමත් විය.
- කාර්යය මණ්ඩලයේ රාජකාරී විෂයන්ට අදාල දැනුම යාවත්කාලීන කිරීමේ අරමුනින් පුහුණු පාඨමාලා වෙත යොමුකරනු ලැබීය.
- සේවක සුබසාධන වැඩපිළිවෙළ තවදුරටත් ශක්තිමත් කළෙමු.
- අලෙවි අංශය පුළුල් කිරීමේ කාර්යයයේදී නිදහස් අලෙවි සේවකයින් බඳවා ගෙන ආයතනයේ මූල්‍ය අංශය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ක්‍රියාවට නංවන ලදී.
- කොවිඩ් වසංගත තත්ත්වය තුළ පවා සියලු නිලධාරීන්ට වැටුප්,අතිකාල දීමනා සහ ප්‍රවාහන පහසුකම් ලබාදෙමින් ආයතන පරිපාලන ක්‍රියාවලිය සක්‍රියව තබාගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබීය.

රජයේ වෙළෙඳ ප්‍රචාරණ ආයතනය ලෙස අප සතු සාමුහික වගකීම් සහ කාර්යයභාරය වටහා ගනිමින් එකම අරමුණකින් ඉදිරියට යාම සඳහා අප අංශය ශක්තිමත්ව ඉහළ කළමනාකාරිත්වය සමග අත්වැල් බැඳගනිමින් සාර්ථකත්වය වෙත පියමංකරමින් සිටින බව සතුටින් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමු.

නිෂ්පාදන අංශය

සැලසිනෙ ආයතනයේ ක්‍රියාකාරී හදවත ලෙස නිෂ්පාදන අංශය හැඳින්වීම වඩාත් ගැලපේ. රජයේ සංවර්ධන ව්‍යාපෘතීන් ජනගත කිරීම සඳහා වාර්තා වැඩසටහන් ප්‍රචාරක දැන්වීම් සකස් කිරීමේ කාර්යය ආරම්භයේ දී අප අංශය වෙත පැවරී තිබූ කාර්යයන් විය. ගතවූ 38 වසරක කාලය තුළ නිෂ්පාදන අංශය වඩාත් සක්‍රීය ලෙස සැලසිනෙ ආයතනයේ වෙළෙඳ දැන්වීම් නිර්මාණය, වාර්තා වැඩසටහන්, රූපවාහනී නාට්‍ය නිර්මාණයේ යෙදෙමින් ඉදිරි පියවර ගණනාවක් තැබීමට සමත්ව සිටී. එමෙන්ම රජයේ කාලීන අවශ්‍යතා අනුව නූතන තාක්ෂණය ඔස්සේ තරඟකාරී ලෙස ගුණාත්මක තත්ත්වයෙන් උසස් වැඩසටහන් නිර්මාණශීලීව නිෂ්පාදනය දක්වා දිගු පියවර රැසක් දැනටමත් තබා අවසන්ය.

2020 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සඳහා වාර්තා චිත්‍රපටයක් නිර්මාණය කිරීම අප විසින් සිදුකළ කාර්යයන් අතර වේ. මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව වෙනුවෙන් කුඩා ව්‍යාපාර දිරිගැන්වීම් සඳහා වාර්තා වැඩසටහන් 75 ක් සාර්ථකව නිර්මාණය කර ආයතනයේ මූල්‍යමය සාර්ථකත්වයට දායකත්වය දැක්වීමට කටයුතු කළෙමු.

කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ රට මුහුණ දී සිටින අවදානම් තත්ත්වය තුළ පවා නිෂ්පාදන අංශය ක්‍රියාත්මක වෙමින් ආයතන අවශ්‍යතා සහ රජයේ ප්‍රචාරණ කාර්යයන් වෙනුවෙන් උපරිම දායකත්වය දැක්වීමට ක්‍රියා කළෙමු.

නිෂ්පාදන අංශය මේ වනවිට තවදුරටත් ශක්තිමත් සහ කාලීන දැනුමින්, තාක්ෂණයෙන් සන්නද්ධව ඉදිරිගාමීව කටයුතු කිරීමට සූදානමින් සිටී.

මූල්‍ය අංශය

2020 වර්ෂය කොරෝනා වසංගතය සමග ආරම්භ වුවද, සැලසිනෙ ආයතනයේ අප අංශය වඩාත් කාර්යක්ෂම ලෙස ගිණුම් කටයුතු කරගෙන යෑමට අවශ්‍ය පියවර ගන්නා ලදි. විවිධ දුෂ්කරතා හා බාධක පැමිණියද මෙම වසරේ සියළු ගෙවීම් කටයුතු සඳහා අවශ්‍ය බැරකම් පිළිබඳව නොපමාව පරිගණක ගත කිරීමට පියවර ගන්නා ලදි. පසුගිය වසරට සාපේක්ෂව 2020 වසරේ දී ගිණුම් කටයුතු යථා තත්වයට ගෙන ඒමට වැඩි වෙහෙසක් දැරීමට සිදු විය. රජයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සියලුම ගිණුම් කටයුතු සිදු කරනු ලැබීය. ගෙවිය යුතු ණය මුදල් රාශියක් සැපයුම්කරුවන් වෙත නියමිත පරිදි ගෙවීමට හැකිවිය. ලැබිය යුතු හිඟ මුදල් ලබා ගැනීමේ වැඩපිළිවෙලක් ද සකස් කෙරුණි.

එමෙන්ම, ගිණුම් වාර්තා සැකසීම, තොරතුරු අමාත්‍යංශය හා විගණනය වෙත කඩිනමින් ලබා දීම, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ඇතුළු පාර්ශ්වයන් වෙත තොරතුරු කඩිනමින් ලබා දීමට පියවර ගනු ගන්නා ලදි. 2014, 2015, 2016, 2017, 2018, 2019 යන වර්ෂවලදී මෙන්ම නැවත වරක් 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්ති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පෙන්නුම් කරන බව විගණකාධිපති මතයක් පල කිරීම සැලකිය යුතු ජයග්‍රහණයක් බව සඳහන් කළ යුතුය.

ඉසව් කළමනාකරණ අංශය

සැලසිනෙ රූපවාහිනී ආයතනයේ ඉසව් අංශය ආයතනයේ ආදායම් ඉපයීම් උදෙසා ඉතා සීඝ්‍ර දායකත්වයක් ලබා දෙන අංශයක් බවට මේ වන විට පත්ව තිබේ. නව දැක්මක් සහිතව වෙනස් වූ ක්‍රම වේදයකින් ඉසව් කළමනාකරණයට නව්‍යවාදී මුහුණුවරක් ඇති කිරීමට වර්ථමානයේ මෙම අංශය සමත් වී සිටී. සෑම වර්ෂයකම විශාල ආදායමක් ඉපයූ ඉසව් කළමනාකරණ අංශය මෙම වසරේදී ඉතා අභියෝගාත්මක ගැටලු රැසකට මුහුණදුණි. අප ආයතනය වෙතින් සිදු කර ගැනීමට සැලසුම් කර තිබූ ඉසව් රැසක් පවතින කොවිඩ් 19 වසංගතය හා සෞඛ්‍ය අංශ මගින් ඉදිරිපත් කර ඇති මාර්ගෝපදේශයන් හේතු කොට ගෙන අවලංගු විය. පූර්ණ වශයෙන් රට වසා දැමීම හා සංචරණ සීමා මෙන්ම සෞඛ්‍ය නීති රීති වලට ගරුකරමින් අප ආයතනයද ඉසව් සංවිධානය කිරීමේ කටයුතු සිදු නොකිරීමට වග බලා ගන්නා ලදි.

කොවිඩ් 19 වසංගත තත්වය පහව ගිය පසුව අප ආයතනය නැවතත් ඉසව් කළමනාකරණයට යොමු වෙමින් අප සමග ගනුදෙනු කරණා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සමග එක්ව නැවතත් ඉසව් කළමනාකරණ කටයුතු සිදු කරමින් ආදායම් ලැබීමේ ක්‍රම ගැන මනා විශ්ලේෂනයක් කරමින් 2021 වර්ෂයේ ආදායම තවදුරටත් වර්ධනය කර ගැනීමට අපේක්ෂා කර ගැනීම මෙම අංශයේ අරමුණයි.

මූල්‍ය වාර්තාව 2020

ආදායම් වර්ධනය



පසුගිය වසර පහ තුළ ආදායම් සහ සෘජු වියදමෙහි ප්‍රවණතාවය



2016 - 2020 වසර අතර ආයතනික ලාභයේ උපනතිය

පසුගිය වසර පහ තුළ ආදායම් සහ දළ ලාභයෙහි උපනතිය



මූල්‍ය වාර්තා සඳහා සටහන්

2020 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ගිණුම් ප්‍රතිපත්ති

1. පොදු කරුණු

1.1 සංයුක්ත තොරතුරු

සැලසිනෙ රූපවාහිනී ආයතනය (මින් පසු සැලසිනෙ නාමයෙන් හැඳින්වෙන) 2019.02.26 වෙනි දිනැති අංක 2112/13 දරන විශේෂ ගැසට් නිවේදනය මගින් ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි විෂය පථයට ඇතුළත් කෙරිණි.

1.2 මූලික කාර්යයන් සහ මෙහෙයුම් ප්‍රමාණය

ප්‍රචාරණය, රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම ඉසව් කළමනාකරණය සැලසිනෙහි මූලික කාර්යයන් අතර ප්‍රධාන තැනක් ගනී.

1.3 සේවක ප්‍රමාණය

2020.12.31 වන දිනට 54 ක සේවක ප්‍රමාණයක් සිට ඇත.

2. ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳව සුවිශේෂී කරුණුවල සාරාංශය

2.1 පොදු ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කර ඇත්තේ පොදුවේ පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මග පෙන්වීම යටතේ පවත්නා ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලව ය. ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ සකස්කර ඇති අතර, දිගින් දිගටම පවත්වා ගැනීමේ පදනම මත ඉදිරිපත් කර ඇත.

2.2 ස්ථායීතාවය සහ සැසඳුම්

මෙම වසර සඳහා යොදා ගන්නා ලද ගිණුම් ප්‍රතිපත්ති පසුගිය වසරේ දී යොදා ගත් ප්‍රතිපත්ති සමග අනුකූල වේ.

2.3 ණය පිරිවැය

මෙම ණය පිරිවැය හඳුනාගෙන ඇත්තේ අදාළ ගිණුම් කාලය තුළ දරන ලද වියදම් ලෙස ය.

3. වත්කම් තක්සේරුව සහ එහි ඇගයුම් පදනම

3.1 දේපල පිරියත සහ උපකරණ

පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය මත දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ වාර්තා සකස් කර ඇත.

3.2 වෙළඳ සහ ලැබිය යුතු දෑ

වෙළඳ සහ ලැබිය යුතු වෙනත් දෑ ඇස්තමේන්තු කළ උපලබ්ධි අගය මත සඳහන් කර ඇත.

3.3 මුදල් සහ මුදල් වලට සමාන දෑ

මුදල් සහ මුදල් වලට සමාන දෑ සඳහා අතැති මුදල් සහ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු කෙටිකාලීන ඉහළ ද්‍රව ශීලතාවය ඇති ආයෝජන මෙයට ඇතුළත් වේ.

3.4 ක්ෂය කිරීම

ආදායම් ප්‍රකාශය තුළ ක්ෂය වීම් ලෙස හඳුන්වනු ලැබුණේ ප්‍රයෝජනයට ගත හැකි යැයි ඇස්තමේන්තු ගතකර තිබෙන වත්කම් පදනම් කරගත් සරල මාර්ග ක්‍රමය යොදා ගනිමිනි. මූල්‍ය කල්බදු යටතේ පවතින කෙටිකාලීන හා ප්‍රයෝජනයට ගත හැකි සමාන වටිනාකම් සහිත වත්කම් මත ක්ෂය කිරීම් සිදු කර ඇත.

එක් එක් අයිතමයන්ගේ ක්ෂය අනුපාතයන් පහත පරිදි වන අතර, එහි පවත්නා ඇස්තමේන්තු ඵලදායී කාලය සහ සාපේක්ෂ කාලය පහත පරිදි වේ.

ලී බඩු සහ සවිකිරීම්	වර්ෂ 10
පරිගණක උපකරණ	වර්ෂ 05
කාර්යාලයීය උපකරණ	වර්ෂ 10
මෝටර් වාහන	වර්ෂ 05
කැමරා සහ චිත්‍රපට උපකරණ	වර්ෂ 10
පරිගණක මෘදුකාංග	වර්ෂ 10

4. වගකීම් සහ ප්‍රතිපාදන

4.1 වගකීම් වර්ගීකරණය වන්නේ ඉල්ලුම මත ගෙවීමට බැඳී සිටින පවත්නා ශේෂ පත්‍රයේ වගකීම් හෝ ශේෂ පත්‍ර දින සිට වසරක කාලයක් තුළ ය. ශේෂ පත්‍ර දින සිට වසරක කාලයකට පසුව ගෙවීමට නියමිත වගකීම් ලෙස අයිතම වර්ගීකරණය වී ඇත.

4.2 විශ්‍රාම සහ ප්‍රතිලාභ දීමනා

සේවක ප්‍රතිලාභ - LKAS 19 (සංශෝධිත 2006) විධිවිධානයන් යටතේ සියලු සේවකයන්ගේ විශ්‍රාමික ප්‍රතිලාභ සේවයේ පළමු වසරේ සිටම ප්‍රතිපාදනය කර ඇත.

1983 අංක 12 දරන ප්‍රතිලාභ දීමනා පනතට අනුකූලව වී යටතේ වසර 05 ක් එක දිගට පවත්වාගෙන ගොස් සේවය අවසන් කරන්නා වූ සේවකයින් සඳහා වන වගකීමක් ලෙස ප්‍රතිපාදන වෙන් කර ඇත.

4.3 අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

ව්‍යවස්ථාව සහ රෙගුලාසිවලට සමගාමීව සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයට සහ සේවක භාරකාර අරමුදල් දායකත්වයට සුදුසුකම් ලබනු අතර, ආයතනය විසින් 15% ක සහ 3% ක් සේවකයින්ගේ මුළු වේතන ප්‍රමාණයෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් දායක වේ.

5 ආදායම් ප්‍රකාශය

5.1 පිරිවැටුම

සැලසිනෙ පිරිවැටුම ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ, මුද්‍රණ, පුවත්පත් වෙළඳ දැන්වීම් උපලේඛනගත කිරීම්, ඉසව් කළමනාකරණ, සමාජ මාධ්‍ය, රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය තුළින් ලැබේ.

5.2 ආදායම් හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ සසම්භාවී ලෙස ගලා ඒමේ ප්‍රමාණය සහ ආදායම් විශ්වාසී ලෙස ගණනය කිරීම ආදායම් හඳුනා ගැනීම ලෙස හැඳින්වේ.

5.3 වියදම් හඳුනා ගැනීම

වියදම් හඳුනා ගැනීම ආදායම් ප්‍රකාශනයේ සෘජු සම්බන්ධතාවය අතර පිරිවැය සහ විශේෂී අයිතම සඳහා වූ ආදායම් ඉපැයුම් පදනම මත වියදම් හඳුනා ගැනීම සිදු කරනු ලැබේ.

6. අදාළ පාර්ශව අතර ගනුදෙනු

LKAS 24 ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන කාලය තුළ අදාළ පාර්ශව අතර ගනුදෙනු කිසිවක් සිදුකර නොමැත.

7. ශේෂ පත්‍ර දිනයට සිදුවීම් වලට අදාළ පසු ගැලපුම් සටහන්

7.1 මූල්‍ය වාර්තාවෙහි හෙලිදරව් කළ යුතු හෝ ගැළපීම් කළ යුතු ප්‍රමාණාත්මක සිදුවීම් ශේෂ පත්‍ර දිනට පසු සිදු වී නොමැත.

8. ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි ප්‍රමුඛ බැංකුවේ පැවති රු. 300,000.00 ක තැන්පතුව, ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ ගිණුමට මාරුකර ඇත.

9. ණයගැතියන් සඳහා අඩමාණ ණය ලෙස 2.5% ක් වෙන්කර තිබේ. 2006 වසරේ හඳුනානොගත් ණය ගැතියන් සඳහා අඩමාන ණය සම්පූර්ණයෙන්ම වෙන්කොට ඇත.

10. 10.1 සේවකයන් දෙදෙනෙකුට විරුද්ධව ආයතනය විසින් නීතිමය පියවර ගෙන ඇත.

10.2 මෙහි සඳහන් විගණන විමසුම් වලට අනුව ආයතනයේ වත්කම් නැවත ප්‍රති අගය 2021 වර්ෂයේ දී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

ආදායම් ප්‍රකාශය

2020 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	සටහන්	2020 රු.	2019 රු.
ආදායම්	**11**	**233,865,842**	**634,368,092**
සෘජු පිරිවැය	**12**	189,135,680	533,238,084
දළ ලාභය / අලාභය		**44,730,162**	**101,130,008**
වෙනත් මෙහෙයුම් ආදායම්	**13**	6,574,534	7,732,399
පරිපාලන හා ආයතන වියදම්	**14**	(68,760,032)	(76,773,888)
විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්	**15**	(10,891,597)	(20,379,231)
මෙහෙයුම් කටයුතු වලින් ලද ලාභය		**(28,346,933)**	**11,709,288**
මූල්‍ය වියදම්	**16**	(116,795)	(196,806)
වෙනත් වියදම්	**17**	(875,865)	(3,212,272)
බදු හර කිරීමට පෙර ශුද්ධ ලාභය/අලාභය		**(29,339,593)**	**8,300,209**
ආදායම් බදු		-	-
බදු හර කිරීමට පසු ශුද්ධ ලාභය/අලාභය		**(29,339,593)**	**8,300,209**

ශේෂ පත්‍රය

2020 දෙසැම්බර් මස 31 දිනට ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	සටහන්	2020 රු.	2019 රු.
වත්කම්			
ජංගම නොවන			
දේපළ පිරියත හා උපකරණ	18	6,816,245	8,819,372
අස්පෘෂ්‍ය වත්කම්	18-A	2,257,876	2,908,741
මුළු ජංගම නොවන වත්කම්		**9,074,121**	**11,728,113**
ජංගම			
ආයෝජන	19	33,519,646	32,398,200
වෙළඳ හා ලැබිය යුතු වත්කම්	20	300,440,528	393,767,769
වෙනත් ලැබිය යුතු දෑ	21	9,965	1,669,896
මුදල් හා සමාන දෑ	22	7,542,890	27,686,494
ජංගම වත්කම්		**341,513,028**	**455,522,359**
මුළු වත්කම්		**350,587,147**	**467,250,472**
ස්කන්ධ හා වගකීම්			
ස්කන්ධය			
රඳවාගත් ලාභය / අලාභය		99,105,138	124,389,548
මුළු ස්කන්ධය		**99,105,138**	**124,389,548**
වගකීම්			
ජංගම නොවන			
උපචිත පාරිතෝෂික දීමනා	23	16,724,135	16,381,707
මුළු ජංගම නොවන වගකීම්		**16,724,135**	**16,381,707**
ජංගම			
වෙළඳ හා ගෙවිය යුතු වෙනත් වියදම්	24	234,628,323	326,349,665
අත්තිකාරම් ලැබීම්		129,552	129,552
මුළු ජංගම වගකීම්		**234,757,875**	**326,479,217**
මුළු ස්කන්ධ හා වගකීම්		**350,587,147**	**467,250,472**

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වාදෙන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති වලට හා 1971 අංක 38 දරණ මූල්‍ය පනතට අනුකූලව පිළියෙල කර ඇත.

සාමාන්‍යාධිකාරී - සැලසිනෙ රූපවාහිනී ආයතනය

මෙම මූල්‍යමය ප්‍රකාශය සැකසීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් තබන ලදී.

සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2020 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2020 රු.	2019 රු.
මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහය		
බදු හර කිරීමට පෙර ශුද්ධ ලාභය	(29,339,593)	8,300,209
ගැලපීම්;		
පොලී ආදායම්	(4,006,227)	(4,035,768)
දේපල පිරියත හා උපකරණ මත ක්ෂය වෙන්කිරීම්	2,932,251	2,897,602
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	2,656,623	4,766,131
දේපල අපහරණය කිරීමෙන් ලද ලාභය / අලාභය	-	(1,376,057)
අඩමාන ණය වෙන්කිරීම්	(1,181,255)	-
පසුගිය වර්ෂයට අදාළ ගැලපීම්	3,942,031	6,297,513
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	**(24,998,170)**	**16,849,630**
වෙළඳ හා අනෙකුත් ලැබීම් (වැඩිවීම් / අඩුවීම්)	94,508,497	72,207,298
තැම්පත් සහ කලින් කල ගෙවීම් (වැඩිවීම් / අඩුවීම්)	1,659,931	(274,385)
වෙළඳ ණය හිමියෝ හා අනෙකුත් ගෙවීම් (වැඩිවීම් / අඩුවීම්)	(91,731,340)	(68,136,326)
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල්	**(20,551,082)**	**20,646,217**
පාරිතෝෂික ගෙවීම්	(2,314,195)	(303,818)
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්	**(22,865,277)**	**20,342,400**
ආයෝජන කටයුතු වලින් ජනනය වූ මුදල්		
දේපල පිරියත, යන්ත්‍රා හා උපකරණ මිලදී ගැනීම්	(276,259)	1,427,941
පොලී ආදායම්	4,006,227	4,035,768
ස්ථාවර තැම්පතු	(1,121,446)	(11,500,000)
ආයෝජන කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්	**(2,608,522)**	**(6,036,290)**
මූල්‍ය කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
රඳවාගත් ඉපැයීමේ දෝෂ නිවැරදි කිරීම	113,152	-
මූල්‍ය කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්	**113,152**	**-**
මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම / අඩුවීම	**(20,143,603)**	**14,306,109**
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන් A)	27,686,494	13,380,385
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන් A)	**7,542,890**	**27,686,494**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2020 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2020 රු.	2019 රු.
සටහන A		
මුදල් හා මුදල් සමාන දෑ		
ලංකා බැංකුව ජංගම ගිණුම් අංකය - 2323299	1,323,361	3,078,298
ලංකා බැංකුව ඉතිරි කිරීමේ ගිණුම් අංකය - 2329765	326,584	327,396
මහජන බැංකුව 200100130005980	(18,227,500)	(3,652,842)
මහජන බැංකුව 200100110005980	23,638,167	27,571,333
නිෂ්පාදන අත්තිකාරම්	276,209	141,809
අනෙකුත් අත්තිකාරම්	206,070	220,502
	7,542,890	**27,686,494**

ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම්

2020 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	රඳවාගත් ඉපයුම්	2020 රු.
2020 ජනවාරි 1 දිනට ශේෂය	124,502,700	124,502,700
පෙර වර්ෂයට අදාල ගැලපීම් (සටහන 28)	3,942,031	3,942,031
	128,444,731	
වර්ෂය සඳහා ශුද්ධ ලාභය / අලාභය	(29,339,593)	(29,339,593)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**99,105,138**	**99,105,138**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2020 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2020 රු.	2019 රු.
සටහන - 11 - ආදායම්		
නිෂ්පාදන	9,806,793	59,618,406
ග්‍රැෆික් සහ මුද්‍රණ කටයුතු	32,036,158	50,717,766
උපලේඛනගත කිරීම්	178,035,800	375,524,280
ඉසව් කළමනාකරණය	13,957,091	148,333,815
වෙනත්	30,000	-
වෙබ් ආදායම්	-	173,825
	233,865,842	**634,368,092**
සටහන - 12 - සෘජු පිරිවැය		
නිෂ්පාදන වියදම්	5,585,569	38,654,700
ග්‍රැෆික් හා මුද්‍රණ වියදම්	23,800,111	36,176,902
උපලේඛනගත වියදම්	147,427,101	316,005,865
ඉසව් කළමනාකරණ වියදම්	12,322,899	142,256,803
වෙබ් අඩවි වියදම්	-	143,814
	189,135,680	**533,238,084**
සටහන - 13 - වෙනත් මෙහෙයුම් ආදායම්		
සේවක ණය පොළී	96,068	135,683
බැංකු පොළී	3,910,159	4,035,768
අඩමාන ණය අඩී වෙන් කිරීම්	1,181,255	821,491
වත්කම් විකිණීමේ (ලාභය/අලාභය)	13,900	-
වෙනත් ආදායම්	582,152	1,566,457
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම්	606,000	1,078,000
පරිවර්තන ගාස්තු	-	10,000
නිර්මාණ ගාස්තු	185,000	85,000
	6,574,534	**7,732,399**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2020 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2020 රු.	2019 රු.
සටහන - 14 - පරිපාලන හා ආයතන වියදම්		
දීමනා	271,661	17,000
දීමනා - සභාපති	552,000	1,102,083
දීමනා - කොන්ත්‍රාත් සේවාවන්	-	156,010
දීමනා - පුහුණු	96,250	131,250
දීමනා - ප්‍රවාහන	600,000	802,688
දීමනා - ඉන්ධන	231,560	505,767
දීමනා - දුරකතන	-	179,333
විගණන ගාස්තු	204,000	1,194,000
අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වියදම්	-	29,974
දීමනා - අධ්‍යක්ෂක මණ්ඩල	-	105,000
ප්‍රසාද දීමනා	-	1,816,822
ගොඩනැගිලි වියදම්	-	1,842.062
ගොඩනැගිලි කුළී වියදම් - ජාතික චිත්‍රපට සංස්ථාව	3,780,000	3,780,000
පිරිසිදු කිරීමේ හා සනීපාරක්ෂක වියදම්	18,800	71,220
පරිගණක උපාංග අලුත්වැඩියා වියදම්	23,150	12,400
ක්ෂය වීම්	2,353,443	2,246,737
අධ්‍යක්ෂක වේතන	-	526,779
පරිත්‍යාග	-	450,000
විදුලිය	637,050	760,660
සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල	6,045,399	5,027,290
සේවක අර්ථ සාධක අරමුදල	1,209,394	1,084,791
තෑගි වවුචර් වියදම්	-	670,000
පාරිතෝෂික දීමනා	2,656,623	4,766,131
අන්තර්ජාල වියදම්	283,750	245,934
කම්කරු වියදම්	1,000	8,250
පුවත්පත් මිලට ගැනීමේ වියදම්	52,460	63,220
කාර්යාලීය උපකරණ අලුත්වැඩියා වියදම්	160,152	93,895
කාර්යාල නඩත්තු වියදම්	222,493	391,035
තැපැල් ගාස්තු	21,164	26,319
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	822,990	1,477,297
වෘත්තීය ගාස්තු	10,000	95,000
ගිවිසුම් අලුත්කිරීමේ ගාස්තු	-	16,900
ලියාපදිංචි ගාස්තු	132,970	182,270

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2020 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2020 රු.	2019 රු.
සංග්‍රහ වියදම්	75,178	146,870
වැටුප් හා වේතන	42,788,008	38,306,185
ආරක්ෂක සේවා වියදම්	676,940	678,190
ඉඩකඩ වෙන්කර ගැනීම (තාවකාලික)	-	32,200
සේවක රක්ෂණය	1,796,794	2,075,639
සේවක අතිකාල සහ යැපීම් දීමනා	1,285,809	2,693,805
සේවක සුභසාධනය	-	1,055,598
පද්ධති නඩත්තු කිරීමේ වියදම්	17,000	-
දුරකතන ගාස්තු	384,265	480,288
ටෙන්ඩර් ගාස්තු	58,100	165,096
පුහුණු කිරීමේ වැඩසටහන්	179,875	569,472
පරිවර්තන ගාස්තු	391,973	313,508
ජල වියදම්	128,803	334,720
වෙබ් අඩවි යාවත්කාලීන කිරීමේ වියදම්	590,978	44,200
	68,760,032	**76,773,888**

සටහන - 15 - විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්

නිර්මාණ ගාස්තු	-	65,000
ඉන්ධන වියදම්	392,409	630,526
මෝටර්රථ වාහන අළුත්වැඩියා වියදම්	433,847	805,445
මුද්‍රණ වියදම්	-	53,235
අලෙවි දිරි දීමනා	237,545	1,771,420
අලෙවි ප්‍රවර්ධන හා ප්‍රචාරණ වියදම්	37,176	9,000
විශේෂ වට්ටම්	9,572,901	15,134,514
විශේෂ ඉසව් කටයුතු වියදම්	-	975,257
විශේෂ ව්‍යාපෘති කටයුතු වියදම්	-	415,878
ණය අයකර ගැනීමේ විශේෂ වියදම්	3,000	33,500
මුද්දර ගාස්තු	25,700	11,653
ප්‍රවාහන, ගමන් ගාස්තු හා නවතා තැබීමේ ගාස්තු	107,737	446,544
වාහන රක්ෂණ	81,282	27,259
	10,891,597	**20,379,231**

සටහන - 16 - මූල්‍ය වියදම්

බැංකු ගාස්තු	101,154	171,493
බලපත්‍ර හා රක්ෂණ ගාස්තු	15,641	24,672
රුඳවුම් බද්ද	-	641
	116,795	**196,806**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2020 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2020 රු.	2019 රු.
සටහන - 17 - වෙනත් වියදම්		
ගිණුම්කරණ මෘදුකාංග - ක්‍රමක්ෂය	308,900	341,965
ජාලකරණ මෙහෙයුම් - ක්‍රමක්ෂය	341,965	308,900
සේවක වන්දි	-	992,080
විවිධ වියදම්	-	11,337
නෛතික වියදම්	225,000	1,557,991
	875,865	**3,212,272**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2020 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

සටහන් - 18 දේපල පිරියත හා උපකරණ

	01.01.2020 දිනට පිරිවැය රු.	එකතු කිරීම් / මාරු කිරීම් රු.	ඉවත් කිරීම් / මාරු කිරීම් රු..	31.12.2020 දිනට පිරිවැය රු.
18.1 දළ වත්කම්				
ලීබඩු සහ සවිකිරීම්	3,598,752	-	-	3,598,752
පරිගණක උපාංග	8,604,951	3,000	-	8,607,951
කාර්යාල උපකරණ	5,524,623	273,259	-	5,797,882
මෝටර් රථ	7,835,824	-	-	7,835,824
කැමරා සහ උපකරණ	15,148,200	-	-	15,148,200
	40,712,350	**276,259**	**-**	**40,988,609**

	01.01.2020 දිනට ශේෂය රු.	වර්ෂය සඳහා ක්ෂය / මාරු කිරීම් රු.	ඉවත් කිරීම් / ශේෂ ගැලපුම් රු.	31.12.2020 දිනට ශේෂය රු.
18.2 ක්ෂයවීම්				
ලී බඩු සහ සවිකිරීම්	2,182,957	267,881	-	2,450,838
පරිගණක උපාංග	7,056,563	519,251	-	7,575,814
කාර්යාල උපකරණ	3,278,048	419,234	-	3,697,282
මෝටර් රථ	7,835,824	-	-	7,835,824
කැමරා සහ උපකරණ	11,465,529	1,147,077	-	12,612,606
	31,818,921	**2,353,443**	**-**	**34,172,364**
	8,893,429			**6,816,245**

සටහන - 18-A අස්පෘශ්‍ය වත්කම්

ගිණුම්කරණ මෘදුකාංග	3,389,000	-	-	3,389,000
ජාලකරණ මෙහෙයුම්	3,419,651	-	-	3,419,651
	6,808,651	**-**	**-**	**6,808,651**
ක්‍රමක්ෂය				
ගිණුම්කරණ මෘදුකාංග	1,934,769	308,900	-	2,243,669
ජාලකරණ මෙහෙයුම්	1,965,141	341,965	-	2,307,106
	3,899,910	**650,865**	**-**	**4,550,775**
	2,908,741			**2,257,876**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2020 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	සටහන්	2020 රු.	2019 රු.
සටහන - 19 - ආයෝජන			
ලංකා බැංකුව - ගිණුම් අංකය 8162593		500,000	500,000
ණයකර - ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව		398,200	398,200
ලංකා බැංකුව - ගිණුම් අංකය 83636019		7,000,000	7,000,000
මහජන බැංකුව - ගිණුම් අංකය 2006001000052421		8,000,000	8,000,000
මහජන බැංකුව B-581908		5,000,000	5,000,000
ලංකා බැංකුව - ගිණුම් අංකය 84622785		1,635,753	1,500,000
මහජන බැංකුව - ගිණුම් අංකය 2006-00100005485-7		10,985,693	10,000,000
		33,519,646	**32,398,200**
සටහන - 20 - වෙළඳ හා ලැබිය යුතු දෑ			
වෙළෙඳ ණය ගැතියෝ	**20.1**	276,719,441	367,065,849
උත්සව අත්තිකාරම්		57,500	122,500
සේවක ණය		2,323,563	3,233,911
ලැබිය යුතු රක්ෂණ වාරික		210,030	283,064
සේවකයන්ගෙන් ලැබිය යුතු - වෙනත්		228,279	182,847
බැංකු ඇපකර		-	1,398,000
රඳවා ගැනීමේ බදු		82,459	82,459
ආර්ථික සේවා ගාස්තු		3,599,744	3,599,744
උපාලි පුවත්පත් සමාගම		10,695	10,695
ලැබිය යුතු දඩ හා අධිභාර		194,068	194,068
චික්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම		2,538,029	2,538,029
විජය පුවත්පත් සමාගම		188,651	188,651
ඊ.ඒ.පී		3,004	3,004
ලැබිය යුතු කොමිස් මුදල - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව		63,558	63,558
ආපසු ගෙවන තැන්පතු		1,246,000	1,260,500
ලැබිය යුතු බැංකු පොලී ආදායම්		556,439	986,123
සේවක මුදල් වංචාව	**සටහන 20.2**	11,988,000	11,988,000
විවිධ ලැබීම්		63,151	198,851
ඊ-මංසල පාලන ගිණුම		367,917	367,917
		300,440,528	**393,767,769**
සටහන - 20.1 - වෙළෙඳ ණයගැතියෝ			
වෙළෙඳ ණයගැතියෝ		288,959,004	380,483,667
අඩු කලා - බොල් ණය සඳහා වෙන් කිරීම්		(12,236,563)	(13,417,819)
		276,719,441	**367,065,849**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2020 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2020 රු.	2019 රු.

සටහන - 20.2 - සේවක මුදල් වංචාව

ආයතනයේ සේවකයන් විසින් නිසි අධිකාරියකින් තොරව මුදල් ලබාගෙන කරන ලද මූල්‍ය වංචාව පිලිබඳව පොලිස් මූල්‍ය අපරාධ අංශය මගින් විමර්ශන කටයුතු සිදු කරනු ලැබේ. ඒ අනුව මෙම මුදල් අදාල පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට අදාළ නීතිමය කටයුතු කරගෙන යනු ලැබේ.

සටහන - 21 - පෙර ගෙවීම් හා අනෙකුත් ලැබිය යුතු දේ

කලින් කල ගෙවීම්	9,965	1,669,896
	9,965	**1,669,896**

සටහන - 22 - මුදල් මුදල් සමාන දෑ

ලංකා බැංකුව ගි.අ. 2323299	1,323,361	3,078,298
ලංකා බැංකුව ඉතිරි කිරීමේ ගි.අ. 2329765	326,584	327,396
මහජන බැංකුව (ජංගම) ගි.අ. 200100130005980	(18,227,500)	(3,652,842)
මහජන බැංකුව (ඉතිරි කිරීමේ) ගි.අ. 200100110005980	23,638,167	27,571,333
නිෂ්පාදන අත්තිකාරම්	276,209	141,809
වෙනත් අත්තිකාරම්	206,070	220,502
	7,542,890	**27,686,494**

සටහන - 23 - ගෙවිය යුතු පාරිතෝෂික

ඉ / ගෙ ශේෂය	16,381,707	11,919,394
පාරිතෝෂික වියදම් වර්ෂය සඳහා	2,656,623	4,766,131
	19,038,030	16,685,525
පාරිතෝෂික ගෙවීම්	(2,314,195)	(303,818)
ගෙවිය යුතු පාරිතෝෂික	**16,724,135**	**16,381,707**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2020 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2020 රු.	2019 රු.
සටහන - 24 - වෙළෙඳ හා අනිකුත් ගෙවිය යුතු දෑ		
වෙළෙඳ ණයහිමියෝ	144,622,909	233,977,260
දුරකතන ගාස්තු	47,303	47,303
ගෙවිය යුතු අලෙවි කොමිස්	160,535	972,548
උපචිත මුද්දර ගාස්තු	8,150	1,800
වේකතුකල අගය මත බද්ද	17,957,045	22,337,662
ජාතිය ගොඩනැගීමේ බද්ද	24,435,590	24,449,624
ගෙවිය යුතු ගෙවල් කුළී	900,000	900,000
වෙනත් ණය හිමියෝ	5,822,295	9,143,097
ඉන්ධන	41,651	41,651
වැටුප් පාලන හිණුම	66,537	42,939
අවිනිශ්චිත හිණුම	10,353	10,353
පාලන හිණුම - Vision 2020 President Secretariat	616,896	616,896
උපචිත වියදම්	39,869,057	33,731,032
ආපසු ගෙවන තැන්පතු	70,000	77,500
	234,628,323	**326,349,665**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2020 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

සටහන - 25 - සම්බන්ධිත පාර්ශවයන් හෙලිදරව් කිරීම (LKAS 24)

නම	තනතුර	සම්බන්ධතා පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ ස්වභාවය	ලිපිනය
හරිත් ගුණවර්ධන මහතා	සභාපති	නැත	අංක.181/බී 6, සුහද මාවත ඇරැව්වල, පිළියන්දල
ඩබ්ලිව්. එල්. ඒ. කේ. ඒ. ගුණතිලක මහතා	සාමාන්‍යාධිකාරී	නැත	අංක. 03/40, නිවුන්ගම පිළියන්දල

2020 මුදල් වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනය සහ ඉහත දැක්වෙන එක් එක් පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සමඟ සම්බන්ධතා පාර්ශව ගනුදෙනු සිදුනොවීය.

සටහන - 26 - පෙර වර්ෂයේ ගැලපීම්

ගිණුම් නිවැරදි කිරීම	7,931
ණයහිමි ශේෂ නිරවුල් කිරීම	2,223,332
ලෙජර් ගිණුම නිවැරදි කිරීම	2,156,651
ණයගැති ශේෂ නිවැරදි කිරීම	(519,941)
අධි ක්ෂය ගැලපීම - පරිගණක	74,057
	3,942,031

2020 වසරේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව විගණකාධිපතිතුමාගේ මතය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඒඒ/සි/එස්ටීඅයි/4/2020/එෆ්ඒ(i) ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 සැප්තැම්බර් 06 දින

සභාපති

සැලසිනේ රූපවාහිනී ආයතනය

සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් දැනටමත් භාවිතා කරමින් පවතින පිරිවැය රු.27,557,656 ක් වූ දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත 7 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර මෙම වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත කාලය ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර.3 ප්‍රකාරව නැවත ගළපා මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව වෙළඳ ණයගැති හා අනෙකුත් ලැබිය යුතු ශේෂය රු.300,440,528 ක් හා වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂය රු.234,628,323 ක් වුවද ඊට අනුරූපිව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛනවල ශේෂ පිළිවෙලින් රු.279,538,783 ක් හා රු.184,491,960 ක් විය. ඒ අනුව මෙම ශේෂ අතර පිළිවෙලින් රු.20,901,745 ක හා රු.50,136,397 ක වෙනසක් නිරීක්ෂණය වුවද වෙනස්කම්වලට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි.

(ඇ) ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනයේ පූර්ව වර්ෂ ගැලපීම් ලෙස එකතුව රු. 3,942,031 ක් දක්වා තිබුණද එම ගැළපීම් වලට අදාල විස්තර විගණනයට ඉදිරිපත් නොකල අතර නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලද වත්කම් හා වගකීම් මූල්‍ය ප්‍රකාශන වල නැවත ගැලපීමට කටයුතු කර ද නොතිබුණි.

(ඈ) මූල්‍ය පකාශනවල 2020 දෙසැම්බර් 31 දිනට රු. 288,956,004 ක වෙළඳ ණයගැති ශේෂය පෙන්නුම් කළද එම ශේෂ සනාථ කර ගැනීම සඳහා ආයතනය විසින් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. නියැදියක් වශයෙන් රාජ්‍ය ආයතන 05 කින් ලැබිය යුතු ශේෂයන් ලෙස එකතුව රු. 49,561,085 ක් දක්වා තිබුණු නමුත් එවැනි ගෙවිය යුතු ශේෂයක් එම ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.තවද මෙම ණයගැති ශේෂ වලින් රු. 965,071 ක ණයගැතියන් පමණක් ශේෂ සනාථ කිරීම් විගණනය වෙත සෘජුවම ඉදිරිපත් කෙරුණි. මේ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු නයගැති ශේෂයෙහි නිවැරදි භාවය විගණනයේදී පිළිගත නොහැකි විය.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව, ගෙවිය යුතු අගය එකතු කළ බදු හා ජාතිය ගොඩනැඟීමේ බදු පිළිවෙලින් රු.17,957,045 ක් හා රු.24,435,590 ක් වුවද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වාර්තාව අනුව එම වටිනාකම් පිළිවෙලින් රු.11,746,210 ක් හා රු.10,000 ක් විය. එසේ වුවද මෙම වෙනස්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැළපීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව චිත්‍රපට සංස්ථාව වෙත ගෙවිය යුතු ගොඩනැඟිලි කුලි වියදම රු.900,000 ක් වුවද, ජාතික චිත්‍රපට සංස්ථාවේ සාමාන්‍යාධිකාරී විසින් සැලසිනේ රූපවාහිනී ආයතනයේ සභාපති වෙත යොමු කරන ලද විස්තර අනුව, 2020 දෙසැම්බර් 31 දිනට ගොඩනැඟිලි කුලි හිඟ මුදල රු.4,106,000 ක් විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා

වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) ඉදිරිපත් කර තිබූ වෙළඳ ණයගැති කාල විශ්ලේෂණයට අනුව මුළු වෙළඳ ණයගැති ශේෂය වූ රු. 102,598,217 ක ශේෂයෙන් සියයට 36 ක් දින 1825 කට වැඩි කාලසීමාවක සිටද සියයට 34 ක් දින 730-1460 අතර කාලසීමාවක සිටද පැවතුණි. එසේ වුවද, එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) එකතුව රු.26,051,973 ක් වූ ණයහිමි ශේෂ වටිනාකමින් රු.988,904 ක්, රු.10,353 ක්,රු.616,896 ක් හා රු.24,435,590 ක් පිළිවෙලින් වර්ෂ 4කට, වර්ෂ 03කට, වර්ෂ 02කට හා වර්ෂයකට අධික කාලයක සිට පැවතෙන ණය ශේෂ වූ අතර එම ශේෂ වලින් තවදුරටත් වගකීමක් නොමැති ණය ශේෂ පිළිබඳ සොයා බලා ගිණුම්වල ගැළපීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයට පෙර සිට පැවත එන රු.11,988,000 ක මූල්‍ය වංචාවට අදාල අලාභය අයකර ගැනීමට මෙම වාර්තාවේ දිනය වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති